සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

# 6 ශ්‍රේණිය: ඉතිහාසය- 1 වාරය
# 1 පාඩම- ඉතිහාසය හැඳින්වීම

සැකසුම: එම්.ජී.එන් නදීෂාණි

බප/ හො පරගොඩ කිතුලගොඩ ක.වි.


මිනිසුන් බොහෝ කලක සිට පෘථිවිය මත ජීවත් වූ අතර ඒ කාලය තුළ ඔවුන්

- ❖ ලෝකයේ විවිධ ප්‍රදේශවල ජීවත් වූ අයුරු
- ❖ එසේ ජීවත් වීමට පරිසරය සකස් කරගත් ආකාරය
- ❖ එකිනෙකා සමඟ කල් ගත කළ අයුරු අප දැක නැත.

මේ ආදී වූ සිද්ධීන් විස්තර කරන කතාව ඉතිහාසයයි.

- ඒ අනුව ඉතිහාසය යනු කුමක්ද?


**අතීත කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන තොරතුරු සොයා බලා ඒවා පැහැදිලි කිරීමයි.**






# ඉතිහාසය ඉගෙන ගන්නේ කෙසේද?

පැරණි පොත්පත්



ස්මාරක




පැරණි චිත්‍ර



*නටබුන්



*සෙල්ලිපි



* තොරතුරු දන්නා වැඩිහිටියන්, ආගමික නායකයන් හා ප්‍රභූන්





# මූලාශ්‍රය යනු මොනවාද?

- ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපකාරී වන සෑම දෙයක්ම හැඳින්වීමට යොදනු ලබන පොදු නම **මූලාශ්‍රය** යන්නයි.
- **මූලාශ්‍රය ප්‍රධාන වර්ග දෙකකි. එනම්,**
  1. **සාහිත්‍ය මූලාශ්‍රය**
  2. **පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය**

# 1.සාහිත්‍ය මූලාශ්‍රය

- පැරණි පොත්පත් ආදී ලියන දේ හා ජනකතා මීට අයත්වේ.





# 2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

- පැරණි කාලයට අයත් භාණ්ඩ, ගොඩනැගිලි සහ ඒවායේ සුන්බුන් ආදී දේ සහ අතීතයට අයත් දැනට ඉතිරිව පවතින වෙනත් දෑ මීට අයත් වේ.








# ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන මූලාශ්‍රය කිහිපයක්

## දීපවංශය


- වර්ගය: සාහිත්‍ය මූලාශ්‍රය
- රචනා වූ කාලය : ක්‍රිස්තු වර්ෂ හතර වන සියවස
- කර්තෘ : සොයාගෙන නැත.

## මහාවංශය

- වර්ගය: සාහිත්‍ය මූලාශ්‍රය
- රචනා වූ තාලය : ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස
- කර්තෘ : මහාවිහාරයට අනුබද්ධ දික්සද සෙනවියා පිරිවෙන්වාසී මහානාම හිමි

# පොළොන්නරුවේ ගල් විහාරය (උත්තරාරාමය)

- ❖ වර්ගය : පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය
- ❖ ඉදිකරන ලද කාලය : ක්‍රිස්තු වර්ෂයෙන් දොළොස්වන සියවස
- ❖ නිර්මාතෘ : පළමුවන පරාක්‍රමබාහු රජතුමා







# ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන

1. අතීතයේ සිදුවූ දේ අවසන් වී ඇතත් ඒවා මගින් දෙන පණිවිඩය වර්තමානය වඩා යහපත් කරගැනීම සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

නිදසුන් : අතීතයේ මිනිසුන් පරිසර හිතකාමීව ගොවිතැන් කර තිබේ.






- ගොවිතැන් කිරීමේ දී වර්තමානයේ අප මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වනුයේ තෘමිනාශක හා රසායනික පොහොර භාවිතය නිසා ඇතිවී තිබෙන අහිතකර පරිසර තත්ත්වයන්ය.
- එහෙත් අතීතයේ දී ගොවිතැන නිසාවෙන් එවන් පරිසර දූෂණයක් සිදු වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත.
- එලෙස පරිසර හිතකාමී ලෙසින් අතීතයේ ගොවිතැන් සිදු කළේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීමෙන් වර්තමානයේ ගොවිතැන හා සම්බන්ධ බොහොමයක් ගැටලු අප විසඳීමට හැකිය.



# 2. වර්තමානයේ අප දකින දේ හා අසන දේ එසේ වූයේ කෙසේ දැයි තේරුම් ගැනීමට ඉතිහාසය වැදගත් වේ.

නිදසුන් :

- ශ්‍රී ලංකාවේ අකුරු ලිවීම පිළිබඳ අවුරුදු 2500 ක තරම් දිගු ඉතිහාසයක් තිබේ.
- ශ්‍රී අක්ෂරය වර්තමානය දක්වා දියුණුවූ ආකාරය පහත රූපසටහන තුළින් තේරුම් ගත හැක.



3. අතීතයේ ජීවත් වූ අපේ මුතුන් මිත්තන් ලබාගත් ජයග්‍රහණ මෙන්ම ඔවුන් අසාර්ථක වූ අවස්ථා ගැන හොඳින් දැන ගැනීමෙන් වර්තමානයේ දී අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට මග පෙන්වීමක් ලැබේ.

4. එම දැනුමේ ආලෝකයෙන් අනාගතයේ කෙසේ විය යුතුද යන කල්පනාව ඇති කර ගැනීමටත්, ඒ අනුව අපේ රට අනාගතයේ දියුණු කරන්නේ කෙසේද යන කාරණය පහදා ගැනීමටත් ඉතිහාසය මග පෙන්වයි.


5. විවිධ ජන කොටස් ජීවත්වන සමාජයේ ඔවුනොවුන්ගේ ඇදහිලි විශ්වාස ප්‍රධාන කොටගත් සංස්කෘතික අංග වලට ගරු කරමින් සමගියෙන් සහජීවනය පවත්වාගෙන යාමට ඉතිහාසය ඉගෙන ගැනීමෙන් හැකියාව ලැබේ.

# ඉතිහාස කාලය මැන ගන්නේ කෙසේද?

- ඉතිහාසය යනු ඉතා දිගු කාලයක් වන බැවින් එය නිවැරදිව මැන ගැනීම වැදගත් වේ. ඉතිහාසය මිනුම් කරනු ලබන ක්‍රම කිහිපයකි.
    - ❖ ක්‍රිස්තු වර්ෂ
    - ❖ ක්‍රිස්තු පූර්ව
    - ❖ බුද්ධ වර්ෂ
    - ❖ ශක වර්ෂ
    - ❖ හිජ්රි වර්ෂ
    - ❖ පුරාවිද්‍යාත්මක කැණීම්

- ඉතිහාසය මිනුම් කිරීමට සුලභව භාවිත වන ක්‍රම දෙකකි.
- **ක්‍රිස්තු පූර්ව** - ක්‍රිස්තූන් වහන්සේගේ උප්පතිය සිදුවීමට පෙර කාලයයි.

**නිදසුන් : මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ ක්‍රිස්තූන් වහන්සේ ඉපදීමට අවුරුදු දෙසිය පනහකට පෙරය. එනිසා එම සිදුවීම ක්‍රිස්තු පූර්ව දෙසිය පනහට අයත් ලෙස සලකයි.**



❖ ක්‍රිස්තු වර්ෂ - ක්‍රිස්තූන් වහන්සේගේ උප්පත්තියෙන් පසු කාලය ක්‍රිස්තු වර්ෂ ලෙස හඳුන්වයි.

නිදසුන : මින්නේරි වැව ඉදිකළ මහසෙන් රජු ජීවත්වූයේ ක්‍රිස්තූන් වහන්සේගේ උප්පත්තියෙන් අවුරුදු දෙසිය හැත්තෑ හතරක් ගිය පසුවයි. එනම් ක්‍රිස්තු වර්ෂ දෙසිය හැත්තෑ හතරේදීයි.




- **බුද්ධ වර්ෂ** - බුදුන් වහන්සේගේ මහා පරිණිර්වාණය සිදු වූ දින සිට ආරම්භ වේ.
- මෙම දිනය පිළිබද නොයෙක් අදහස් පැවතියද එය ක්‍රිස්තුන් වහන්සේගේ උප්පත්තියට අවුරුදු පන්සිය හතළිස් හතරකට පෙර එනම් ක්‍රිස්තු පූර්ව 544 දී සිදුවූවක් සේ සැලකේ.



❖ **ශක වර්ෂ** - මෙය හින්දු දින දර්ශනයකි.

* එය ක්‍රිස්තු වර්ෂයෙන් 78 දී ආරම්භ වේ.


* ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කළ ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු මෙම වර්ෂ ක්‍රමය ආරම්භ කරන ලද්දේ ශකවරුන් පරදා ඔහු එම ප්‍රදේශ ජයග්‍රහණය කිරීම සිහිකිරීමටය.



❖ හිජ්රි වර්ෂ - මුස්ලිම්වරුන් තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැන ගැනීමට භාවිතා කරයි.

* මෙය ආරම්භ වන්නේ ක්‍රිස්තු වර්ෂ 622 දීය.

* ඉස්ලාම් ආගමේ නායකයා වූ මහම්මත්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණි වර්ෂය එයයි.



# ❖ පුරාවිද්‍යාත්මක කැණීම්

* අවුරුදු ලක්ෂ ගණනක් පැරණි ඉතිහාසය මැනගැනීමට විද්‍යාගාරවල සිදුකරනු ලබන පරීක්ෂණ ක්‍රම ගණනාවක් තිබේ. ක්‍රමානුකූලව පොළව හාරා බැලීමෙන් ද අතීතය මැනගත හැක. එලෙසින් පොළව හෑරීම හඳුන්වනුයේ පුරාවිද්‍යාත්මක කැණීම ලෙසයි.

* පුරාණ කාලයේ සිදුවූ නොයෙක් සිද්ධිවලට අයත්, පහසුවෙන් දිරා නොයන නොයෙකුත් දේ මෙවැනි පොළව යට තිබෙන පස් තට්ටුවල තැන්පත් වී තිබේ. මෙම පස් තට්ටුවල මතු පිට මෑත කාලවලට අයත් දේ තැන්පත්ව ඇති අතර පොළව අභ්‍යන්තරයට යනවිට වඩාත් පැරණිදේත් තැන්පත් වී ඇත.



# ක්‍රිස්තු වර්ෂ ක්‍රමයට අනුව ප්‍රධාන ඓතිහාසික සිද්ධි කිහිපයක් සිදු වූ කාල වකවානු

- ශ්‍රී ලංකාවට නිදහස ලැබීම - ක්‍රිස්තු වර්ෂ 1948
- මහසෙන් රජුගේ කාලය ආරම්භ වීම - ක්‍රිස්තු වර්ෂ 274
- වසභ රජුගේ කාලය ආරම්භ වීම - ක්‍රිස්තු වර්ෂ 67
- ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය - ක්‍රිස්තු වර්ෂ 1
- බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය - ක්‍රිස්තු පූර්ව 544

# බුද්ධ වර්ෂ ක්‍රමයට අනුව ප්‍රධාන ඓතිහාසික සිද්ධි කිහිපයක් සිදු වූ කාල වකවානු

- ❖මහසෙන් රජුගේ කාලය ආරම්භ වීම - බුද්ධ වර්ෂ 818
- ❖වසභ රජුගේ කාලය ආරම්භ වීම - බුද්ධ වර්ෂ 611
- ❖ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය - බුද්ධ වර්ෂ 544
- ❖බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය - බුද්ධ වර්ෂ 1


ස්තූතියි

**සවියෙන් පෙරට අපි එකට**

***e* - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| **ශ්‍රේණිය**<br>**6** | **විෂයය**<br>**ඉතිහාසය** | **වාරය**<br>**1** | **පාඩම**<br>**1. ඉතිහාසය හැඳින්වීම**<br>**ඇගයීම** |
|---|---|---|---|

**සැකසුම: එම්.ජී.එන් නදීෂාණි**

**බප/ හො/ පරගොඩ කිතුලගොඩ ක.වි.**

1. ඉතිහාසය යනු කුමක්ද?
2. මූලාශ්‍ර යනු මොනවාද?
3. ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍ර වර්ග දෙක නම් කරන්න.
4. ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට ඔබට භාවිත කළහැකි මූලාශ්‍ර තුනක් ලියන්න.
5. ඉතිහාසය ඉගෙනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.
6. ඉතිහාස කාල නිර්ණයට යොදාගත හැකි ක්‍රම තුනක් නම් කරන්න.
7. පුරාවිද්‍යාත්මක කැණීමක් ඉතිහාසයේ කාලය මිනුම් කිරීමට වැදගත් වන්නේ කෙසේද?

8. පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

i. මිනිස් ඇටසැකිලි පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් සේ සලකයි. ( )
ii. මහාවංශය ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී රචනා කර තිබේ. ( )
iii. පොළොන්නරුවේ ගල් විහාරය ක්‍රිස්තු වර්ෂයෙන් දොළොස්වන සියවසේ දී ඉදිකරන ලද්දකි. ( )
iv. ක්‍රිස්තුන් වහන්සේගේ උප්පත්තියෙන් පසු කාලය ක්‍රිස්තු පූර්ව ලෙස හඳුන්වයි. ( )
v. බුද්ධ වර්ෂ ආරම්භ වනුයේ බුදුන් වහන්සේගේ උප්පත්තිය සිදු වූ දා සිටය. ( )
vi. මුස්ලිම්වරුන් තමන්ගේ ආගමික උත්සව පවත්වන කාලය මැන ගැනීමට හිජ්රි වර්ෂ ක්‍රමය යොදා ගනී. ( )
vii. මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ ක්‍රිස්තු පූර්ව 250 දීය. ( )

9. නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.
( සාහිත්‍ය, ක්‍රිස්තු වර්ෂ 1948, මහාවංශය, 1, ක්‍රිස්තු පූර්ව, හිජ්රි වර්ෂ ක්‍රමය, 274, ක්‍රිස්තු වර්ෂ, ශක වර්ෂ, මහා පරාක්‍රමබාහු )

i. දීපවංශය ලංකාවේ ඉතිහාසය හැදෑරීමට වැදගත්වන .................................... මූලාශ්‍රයකි.
ii. පොළොන්නරුවේ ගල් විහාරය .................................. රජු විසින් ඉදි කර තිබේ.
iii. මහා විහාරයට අනුබද්ධ දික්සඳ සෙනවියා පිරිවෙන්වාසී මහානාම හිමි .................................. කෘතිය රචනාකර ඇත.

iv. ක්‍රිස්තුන් වහන්සේගේ උප්පත්තිය සිදු වීමට පෙර කාලය ........................... ලෙසද ක්‍රිස්තුන් වහන්සේගේ උප්පත්තියට පසු කාලය ................................. ලෙස ද හඳුන්වයි.

v. ...................................... දී ශ්‍රී ලංකාවට නිදහස ලැබිණි.

vi. බුදුන්වහන්සේ පිරිණිවන් පෑ වසර බුද්ධ වර්ෂ ....................... දීය.

vii. .......................................... ක්‍රමය හින්දු දින දර්ශනයකි.

viii. මහසෙන් රජු ජීවත්වූයේ ක්‍රිස්තු වර්ෂයෙන් ...........................දීය.

ix. .................................. ක්‍රමය ඉස්ලාම් ආගමේ නායකයා වූ මහම්මත්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණීමේ වර්ෂය අනුව ආරම්භ වූවකි.

**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය<br>6 | විෂයය<br>ඉතිහාසය | වාරය<br>1 | පාඩම<br>1. ඉතිහාසය හැඳින්වීම<br>පිළිතුරු |
|---|---|---|---|

**සැකසුම: එම්.ජී.එන් නදීෂාණි**

**බප/ හො/ පරගොඩ කිතුලගොඩ ක.වි.**

1. අතීත කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන තොරතුරු සොයාබලා ඒවා පැහැදිලි කිරිම ඉතිහාසයයි.
2. ඉතිහාසය පිළිබඳ දැනුම ලබා ගැනීමට උපකාරීවන සෑම දෙයක්ම හැඳින්වීමට පොදුවේ යොදන නම මූලාශ්‍ර යන්නයි.
3. සාහිත්‍ය මූලාශ්‍ර,පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
4. ලොග් සටහන් පොත, පාසලේ ආදි සිසුන්, ගමේ වැඩිහිටියන්, නාම ලේඛන, පැරණි ඡායාරූප
5. අතීතයේ සිදුවූ දේ අවසන් වී ඇතත් ඒවා මගින් දෙන පණිවිඩය වර්තමානය වඩා යහපත් කරගැනීමට වැදගත් වේ.
   - වර්තමානයේ අප දකින දේ හා අසන දේ එසේ වූයේ කෙසේ දැයි තේරුම් ගැනීමට ඉතිහාසය වැදගත් වේ.
   - අතීතයේ ජීවත් වූ මුතුන් මිත්තන් ලබාගත් ජයග්‍රහණ මෙන්ම ඔවුන් අසාර්ථක වූ අවස්ථා දැන ගැනීමෙන් වර්තමානයේ දී අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට මග පෙන්වීමක් ලැබේ.
   - එම දැනුමේ ආලෝකයෙන් අනාගතය කෙසේ විය යුතු ද යන කල්පනාව ඇතිකර ගැනීමටත්, ඒ අනුව අපේ රට අනාගතයේ දී දියුණු කරන්නේ කෙසේ ද යන කාරණය පහදා ගැනිමටත් ඉතිහාසය මග පෙන්වයි.

- විවිධ ජන කොටස් ජීවත්වන සමාජයේ ඔවුනොවුන්ගේ ඇදහිලි විශ්වාස ප්‍රධාන කොටගත් සංස්කෘතික අංගවලට ගරුකරමින් සමගියෙන් සහජීවනය පවත්වා ගැනීමට ඉතිහාසය වැදගත්ය.

6. ක්‍රිස්තු පූර්ව, ක්‍රිස්තු වර්ෂ, ශක වර්ෂ, බුද්ධ වර්ෂ, හිජ්රි වර්ෂ, පුරාවිද්‍යාත්මක කැණීම්
7. පුරාණ කාලයේ සිදු වූ නොයෙක් සිද්ධි වලට අයත් දිරා නොයන නොයෙක්කුත් දේ පොළව මතුපිට හා අභ්‍යන්තරයේ තැන්පත්ව ඇත. ක්‍රමානුකූලව පොළව හාරා බලමින් සිදු කරනු ලබන පුරාවිද්‍යාත්මක කැණීම් මගින් ඒවා අධ්‍යයනය කර ඉතිහාසය මිනුම් කළ හැකිවේ.
8.
   i. ✓
   ii. ✗
   iii. ✓
   iv. ✗
   v. ✗
   vi. ✓
   vii. ✓
9.
   i. සාහිත්‍ය
   ii. මහා පරාක්‍රමබාහු
   iii. මහාවංශය
   iv. ක්‍රිස්තු පූර්ව, ක්‍රිස්තු වර්ෂ
   v. ක්‍රිස්තු වර්ෂ 1948
   vi. 1
   vii. ශක වර්ෂ
   viii. 274
   ix. හිජ්රි වර්ෂ